
**3.0 නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.**

**3.4.2 අංගරචනයෙහි යෙදෙමු.**

**රූපණයේදී නලු නිළියන්ගේ මුහුණුවල ලක්ෂණ චරිතයට උචිත පරිදි වෙනස් කර ගැනීම** අංගරචනය යනුවෙන් හැඳින්වෙයි.නාට්‍යයක මිනිස්,සත්ව මෙන්ම මනක්කල්පිත චරිත දැකිය හැකි විවිධ වෙයි.ස්ත්‍රී පුරුෂ භාවය අනුව ද පුද්ගල ස්වාභාවයන් වෙනස් වෙයි.එසේ වෙනස් කිරීම සිදු වන්නේ අංගරචනයෙන්ය.අංගරචනය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදෙයි.




**සරල අංගරචනය**

සරල අංගරචනයේදි පුද්ගලයෙකුගේ බාහිර ස්වරූපය ඒ අයුරින් ම ඉදිරිපත් කරයි.සරල අංගරචනය අවශ්‍ය වන්නේ වේදිකා ආලෝකය මඟින් ඇතිවන වෙනස් වීම මඟහැර මුහුණේ ත්‍රිමාන හැඩතල හා ඉන්ද්‍රියන් පැහැදිලිව පෙනීමටයි.එමෙන්ම ඇතැම් රංග වස්ත්‍ර වල හා රංග ආභරණ වල වර්ණ මුහුණ අපැහැදිලි කිරීමට හේතු වෙයි.නලුවාගේ මුහුණ ඉතාමත් වැදගත් බැවින් අංගරචනය කළ යුතුය.සරල අංගරචනය සඳහා උදාහරණ පහත රූප සටහන් ඇසුරින් දක්වා තිබේ.





සරල අංගරචනයක් සිදු කරගන්නා ආකාරය වඩාත් හොඳින් පැහැදිලි කර ගැනීම සඳහා පහත සබැඳිය වෙත පිවිසෙන්න

https://youtu.be/csosHts7IU8

## චරිතාංග අංගරචනය

චරිතාංග අංගරචනයේදී පුද්ගලයෙකුගේ භාහිර ස්වරූපය වෙනත් අයුරකින් රචනා කරනු ලබයි.නිරූපණය කළ යුතු චරිතයට අනුව නලුවාට වෙස් වලා ගැනීමට චරිතාංග අංගරචනය උපකාරී වෙයි.මෙහිදී ඒ ඒ චරිතයට අනුව අංගරචනය වෙනස් වෙයි.කලාත්මක ක්‍රම හා නිර්මාණශීලී බව අවශ්‍ය වන්නේ චරිතාංග අංගරචනයේදීය.සාමාන්‍ය අංගරචනයකදී මෙන් නොව අංගරචනා ශිල්පියාට තම ශිල්පීය නිපුණත්වය පෙන්විය හැකි සුවිශේසී අවස්ථාවක් ලෙස මෙය දැක්විය හැකියචරිතාංග අංගරචනයකට උදාහරණ පහත දක්වා ඇති අතර ඒ සමඟ දක්වා ඇති සබැඳියෙන් අංගරචනයක් සිදු කරන අයුරු වීඩියෝ දර්ශණ මගින් නරඹා අත්දැකීම් එක්කරගන්න.




චරිතාංග අංගරචනයේදී එය සිදු කරන අන්දම පිළිබඳව පහත සබැඳියෙන් අදහසක් ලබා ගන්න.

https://youtu.be/0fDcNbv9u_U

ශෛලිගත අංගරචනය හා මනක්කල්පිත අංගරචනය යනුවෙන් තවත් දෙආකාරයක අංගරචනා වර්ග දැතගත හැකිය අඳුර හා එළිය පිළිබඳව මූලධර්මය අංගරචනයේදී වැදගත් වෙයි. මුහුණේ  අඳුරු ප්‍රදේශ ඇතුළට ද දීප්තිමත් ස්ථානයන් පිටතට ද දිස්වන බැවින් මුහුණක හැඩතල වෙනස්වීමට වේදිකා ආලෝකකරණය දැඩි බලපෑමක් සිදු කරනු ලබයි.ප්‍රබල විදුලි පහනකින් නික්මෙන ආලෝක ධාරාවක් මුහුණ මත පතිත වීමෙන් මුහුණේ පැතලි ස්වාභාවයක් ඇති වෙයි.මුහුනේ  අංග පැහැදිලිව ත්‍රිමාණ ලෙස මතු කර ගැනීමට වර්ණ භාවිතා කිරීම අංගරචනයේදී සිදු වෙයි.

★නාට්‍යයේ පෙළ පිළිබඳව හා නාට්‍යයේ ශෛලිය පිළිබඳව මනා අවබෝධයක් තිබීම.

★නාට්‍ය නිරූපණය වන කාලය පිළිබඳව

★නාට්‍යයට අදාළ දේශය හා යුගය පිළිබඳව

★අදාළ භූමිකාව පිළිබඳව මනා අවබෝධයක් සහිත වීම

★පුද්ගල හා සත්ව චරිත පිළිබඳව අවධානය යොමු කිරීම

★අනුමත අමුද්‍රව්‍ය පමණක් යොදා ගැනීම

★නලුවාට ඇති ආසාත්මිකතා පිළිබඳව සොයා බැලීම

වැනි කරුණු පිළිබඳව අංගරචනා ශිල්පියා අවධානය යොමු කළ යුතුය.

සත්ව චරිතයන් අංගරචනය කිරීමේ දී සත්ව චරිතය සංකේතවත් වන අයුරින් අංගරචනය කළ යුතු වෙයි. සත්ව රූප නාට්‍යයක චරිත බවට පත් කිරීමේ දී නිර්මාණාත්මක ප්‍රතිනිරූපණයක් සිදු විය යුතුය.අංග රචනය කිරීම සඳහා යොදා ගත් සත්ව රූපය මිනිස් මුහුණක අංගරචනය කිරීම සඳහා සුදුසු සැළැස්මක් ශිල්පියා සකසා ගත යුතු වෙයි.මන් ද අංගරචනය සෑම විටම නිර්මාණශීලී කටයුත්තක් වන බැවින් එම නිර්මානය කලින් සැළසුම් කිරීම නුවණට හුරුය.එවිට එම සැළසුම අනුව යමින් අංගරචනය කළ හැකිය.

අදාළ සැළසුම අනුව සත්ව චරිතයක් සඳහා අංගරචනයක් සිදු කරන ආකාරය පිළිබඳව පහත සබැඳියෙන් අදහසත් ලබා ගන්න.

https://youtu.be/4_Z-b4B5YkE